මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | විදේශ විනිමය දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2022.08.18 |

**අතැති විදේශ ව්‍යවහාර මුදල් තැන්පත් කිරීම හෝ/ විකිණීම සඳහා මහජනතාව වෙත පොදු සමා කාලයක් ලබා දීම**

මහජනතාව අතැති විදේශ ව්‍යවහාර මුදල්, බැංකු පද්ධතියට ආකර්ෂණය කර ගැනීම පිණිස මුදල් අමාත්‍යවරයා විසින්, තමා සන්තකයේ විදේශ ව්‍යවහාර මුදල් තබා ගෙන සිටින ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික පුද්ගලයන් හට පහත සඳහන් දෑ සඳහා **2022.08.15 දින සිට මසක පොදු සමා කාලයක්** ලබා දී ඇත.

(i) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට **තැන්පත් කිරීමට**

හෝ

(ii) බලයලත් වෙළෙන්දෙකුට (බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවට) **විකිණීමට**

වැඩිදුර තොරතුරු සඳහා;

(අ) ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමඟ සම්බන්ධ වීමට

(ආ) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.dfe.lk මගින් විදේශ විනිමය පනතේ 8 වැනි වගන්තිය යටතේ වූ නියමයට 2022 අගෝස්තු 15 දිනැති අංක 2293/07 දරන (අති විශෙෂ) ගැසට් නිවේදනය මගින් සිදු කරන ලද ඉහත සංශෝධනයන් පරිශීලනය කිරීමට,

(ඇ) dfe@cbsl.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයෙන් හෝ 011-2477255, 011-2398511 යන දුරකතන අංක මගින් විදේශ විනිමය දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වීමට

හැකියාව ඇත.